# නැටුම් විෂය කණිෂ්ඨ ද්විතීයික පාසල් මට්ටමේදී වින්දනයක් ලැබෙනසේ ඉගැන්වීම සහ එය නාට්‍ය කරණයට උපකාරි වන අයුරු විමසීම.

1977 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයයේ පවත්වන ලද අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන අධි නිබන්ධනය.

1979 දෙසැම්බර්

**ඩී. එම්. ජයතිලක**
ශාස්ත්‍රවේදී විද්‍යාලංකාර
විශ්ව විද්‍යාලය.
අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)
විද්‍යෝදය විශ්ව විද්‍යාලය

# ANINVESTIGATION TO ASCERTAIN HOW THE TEACHING OF DANCING AT THE JUNIOR SECONDARY LEVEL EVELOPS AESTHETIC APPRECIATION AND ASSISTS DRAMATIZATION

ADISSERTATION SUBMITTED IN PARTIAL FULFILMENT OF THE REQUIREMENTS FOR THE MASTER OF ARTS (M.A. (Education) TWO YEAR DEGREE COURSE

1979 DECEMBER


D.M. JAYATILEKE

B.A.(General) VIDYALANKARA UNIVERSITY

DIPLOMA IN EDUCATION (Merit) VIDYODAYA

29/11, Madiwela Road,
Nugegoda

Regional Education Dept.
Bandarawela.



UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA

UCLIB
376650

REFERENCE
NOT TO BE
REMOVED

සංක්ෂේපයෙන්:-

ලංකාවේ නැටුම් හෝ නාට්‍ය විෂයය විමර්ශනයට භාජනය කිරීමේදී එයට දීර්ඝ ඉතිහාසයක් ඇති බව පෙනේ. මහින්දා ගමනයෙන් පසුව සෑම කලා ශිල්පයක්ම මට සිළුව අර්ථාන්විත බැවින් ගොඩ නැගුණු අතර නැටුම් සහ නාට්‍ය විෂය ද නව ස්වරූපයක් ගැනුණි.

නැටුම් සහ නාට්‍ය ආගමික උත්සව ආදියටත්, සටන් සඳහා පෙරමුණ ගත් යුද්ධ හමුදා ප්‍රබෝධමත් කිරීමට සහ ධෛර්යමත් කිරීමටත් යොදා ගත් බව වංශ කථා වල සඳහන් වේ. ථූප වංශය නාටිකාංගනාවන් විශාල පිරිසක් ස්ථූප වන්දනාව සඳහා පූජා පෙළහර පවත්වමින් රඟ පෑ බව සඳහන් කරයි. තිර මත ඡායා නැගෙන සේ වේදිකාව පිටුපස සිට ප්‍රේක්ෂකයින්ට නාට්‍ය මගින් විවිධ අර්ථවත් කතාන්තර ඉදිරිපත් කළ ඡායා නාට්‍ය මෙහි පැවති බව මහා වංශය කියයි.

සිව් සැට කලා ශිල්ප ප්‍රගුණ කිරීමේදී නැටුම් සහ නාට්‍ය ප්‍රගුණ කිරීමද ඉතා වැදගත් කොට සලකා තිබේ. රජවරුන් සහ බිසෝවරුන් නර්තන දක්ෂතා ප්‍රගුණ කරමින් නැටුම් මණ්ඩප රජ මාළිගා අසල පවත්වා ගෙන ගොස් ඇති අතර, ප්‍රභූ ජනයා නැටුම් සහ නාට්‍ය කලාවට උසස් ස්ථානයක් දීමෙන් මෙම විෂය ජනප්‍රිය සේම ප්‍රියතම විෂයයක් වශයෙන් ද පැවති ඇති බව පැහැදිලිය.

අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි, කෝට්ටේ ආදී අවධිවල නැටුම් සහ නාට්‍ය විෂය උසස් මට්ටමකින් පැවති බව එකල රචිත සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් වේ. එහෙත් කලින් කළ ලංකාවට එල්ල වූ සතුරු ආක්‍රමණ නිසා ඇතිවූ රාජ්‍ය පිරිහීම් සමගම මෙම විෂය ද පිරිහී ගියා සැක නැත.

නැටුම් විෂය සහ නාට්‍ය විෂය සඳහා වඩා බලවත් පහරක් එල්ල වී ඇත්තේ ක්‍රි.ව. 1500න් පසුව ය. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ආදී අවධිවල මෙම විෂයයට කිසිදු සැළකිල්ලක් නො ලැබුණු නිසා මෙම විෂයය බොහෝ සෙයින් පිරිහී ගිය බව පැහැදිලි වේ. මෙම අවධියේ දේශීය වශයෙන් පැවති නැටුම් ප්‍රාදේශීය වශයෙන් වෙන් වෙන්ව පිරිහෙමින් පැවත වීත් ඇත. කන්ද උඩරට අනෙක් ප්‍රදේශ වලින් වෙන්ව පැවති අවධියේ උඩ රටට ආවේනික වූ උඩරට නැටුම් සම්ප්‍රදාය පහත රට සහ සබරගමු නැටුමින් එකලාව පාරම්පරිකව පැවත ආ බව ද පෙනී යයි. සබරගමු නැටුම් වශයෙන් ප්‍රාදේශීය ස්වරූපයක් ගත් නැටුම් ක්‍රමයක් බිහිවීමට උත්සහ දැරුවද එහි දක්නට ලැබෙන්නේද පිරිහුණු ලක්ෂණයි. දිග්ගෙයි නැටුම මෙහි පැවති ජනප්‍රිය නැටුම්

විශේෂයක් වුවද අද එම නැටුම් දැකීමට නොහැකි තරම් පිරිහී ගොසිනි. පහත රට නැටුම් , නැටුම් විලාසිතාවන්ගෙන් පෝෂණය ලක්ෂණයක් පෙන්නුම් කළ ද එය බෙහෙවින් බර වූයේ ශාන්ති කර්ම සඳහා ය. එසේ වුවත් එහි ස්වාධීන නැටුම් ක්‍රම ආරක්ෂා වීමට තරම් අවස්ථා වූ බව මෙම ශාන්ති කර්ම පරීක්ෂා කිරීමේදී පැහැදිලි වේ. උඩරට නැටුම් දළදා පොරගැර මුල් කරගෙන එත්තරා දුරකට ආරක්ෂා වූ අතර, නැටුම් ගුරු කුල නිසා උඩරට නැටුම බෙහෙවින් ආරක්ෂා වී පැවති බව ද පැහැදිලි වේ. කෙසේ මුත් නිදහස් අධ්‍යාපනය හඳුන්වා දෙන තෙක් දේශීය කලා ශිල්ප දේශීය ස්වරූපයකින් සංවර්ධනය වූ බවක් නොපෙනේ.

1940 ගණන්වල ගුරුවරුන් කිදෙනෙකුගෙන් පාසල් විෂයයක් වශයෙන් නැටුම් විෂය, ආරම්භ විය. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණයත් සමගම නැටුම්, චිත්‍ර, සංගීත විෂයයන් සමෝධාන වී සෞන්දර්ය විෂය වශයෙන් හැඳින් විණි. දේශීය සම්පත් හිඟය නිසා, එම සම්පත් වර්ධනය කර ගන්නා තුරු මෙම විෂයයන් වෙන වෙනම ඉගනීමට සිදුවන බව විෂය නිර්දේශවල සඳහන් වේ. එහෙත් නැටුම් හා නාට්‍ය කරණය යන විෂයයන් දෙක අතර අන්‍යොන්‍ය වශයෙන් තිබෙන බැඳියාව කුමක්ද ; නැටුම් කුශලතා ප්‍රගුණ කිරීමෙන් නාට්‍යමය චරිතවලට පිවිසීමේ රංගන කුශලතා වර්ධනය වන්නේද; ඒ කුමන අන්දමින්ද යන්න මෙම ක්ෂේත්‍රයේ ඇති ගැටළුවකි. එම ගැටළුව දෙස විමර්ශනාත්මකව බැලීමට මෙම නිබන්ධනයෙන් උත්සාහ දරා ඇත.

නැටුම් විෂය හා නාට්‍ය කරණය අතර ඇති සම්බන්ධය විමසා බැලීමටත්, නැටුම් විෂය වින්දනාත්මක ප්‍රිය මනාප විෂයයක් වශයෙන් ඉගෙන ගැනීමට ඇති කර ගත යුතු වෙනස් කම් විෂය නිර්දේශය වශයෙන්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුලින්, ඒ සඳහා සුදුසු ඉගැන්වීම් ක්‍රම ආදිය ගැන ප්‍රශ්නාවලිය මඟින් සොයා බලන ලදි. නැටුම් විෂය තුල කළ යුතු පර්යේෂණ රාශියකි. ශාස්ත්‍රීය කරුණු ගැන, වාදන ගායන රටා ගැන, නිර්මාණාත්මක නාට්‍ය ගැන ආදී වශයෙනි.

මෙහිදී නැටුම් විෂය වින්දනයක් ලබන සේ ඉගෙනීමත්, එය නාට්‍ය කරණයට ගෝචර වනසේ සංවිධානය කර ඉගෙනීම ත් කළ යුතු ආකාරය විමසන ලදි. නැටුම් විෂය ඉගෙන ගත්තද එහි දක්ෂතා නාට්‍ය කරණයටද උපකාරී විය යුතුවා පමණක් නොව සංකීරණ දක්ෂතා ලබා ගත යුතු නාට්‍ය කරණය පිළිබඳ එම දක්ෂතාවයන් ගැන අවබෝධයක් ලබා ගත යුත්තේ කෙසේ දැයි විමසීම මෙම පර්යේෂණයේ මූලික අරමුණක් විය.

මේ සඳහා නැටුම් විෂය ගැන ඓතිහාසික වශයෙන් පරීක්ෂා කළ අතර, වින්දන ක්ෂේත්‍රය ගැනත්, 6, 7, 8, 9 ශ්‍රේණිවල ළමුන්ගෙන් නැටුම් විෂය තුලින් අපේක්ෂිත අධ්‍යාපනික අරමුණුත් විමසන ලදි. මධ්‍ය වාර්ෂික පරීක්ෂණ විග්‍රහය (6, 7, 8 ශ්‍රේණි සඳහා) සහ ජාතික අ.පො.ස.(සා)පෙළ විභාගයේ ශාස්ත්‍රීය මට්ටමේදී විෂය පිළිබඳ සාධන මට්ටම් ගැන විමසීමටත් විෂය දැනුම පිළිබඳ පරීක්ෂණ ලකුණුත් පිළිබඳව ඇති සහ සම්බන්ධතාවද පරීක්ෂා කිරීමත් කරන ලදි. ප්‍රශ්නාවලිය තුලින් විෂය නිර්දේශය ළමයා ගුරුවරයා වශයෙන් සංවිධානය විය යුතු ආකාරය හෙළි කරන කරුණු රාශියක්ම හෙළි දරව් වී ඇත. නාට්‍ය කරණයේ මූලික ලක්ෂණත් ළමා වර්ධනයට ගැලපෙන අයුරින් එම කුසලතා සංවර්ධනය කිරම සඳහා ගත යුතු ක්‍රියා මාර්ගයත් විමසන ලදි. අවසාන පරිච්ඡේදයේදී මෙම කරුණු සියල්ලම සම්පිණ්ඩනය කර දක්වා ඇත. නැටුම් විෂය තුළ නාට්‍ය කරණ ලක්ෂණ රාශියක් එළිදරව්වේ. නිර්මාණාත්මක නාට්‍යකරණය පිළිබඳ ප්‍රබුද්ධ ළමා මනසක් ඇති කිරීමට නම් මෙම විෂයන් දෙකේ සියුම් වෙනස්කම් මෙන්ම මේ විෂයන් දෙක අතර ඇති සහ සම්බන්ධතාව ගැන මනා අවබෝධයක් ඇගයීම තුලින් ලබා ගැනීමට ශිෂ්‍යයාට ඉඩ සලසා දිය යුතු ය. ඒ පිළිබඳ කුසලතා ද ශිෂ්‍යයා තුළ වර්ධනය කළ යුතු ය. මෙම කරුණු පිළිබඳව එක්තරා දුරකට විමසා බැලීමත් මෙම පරීක්ෂණය තුලින් සිදු කෙරී ඇත.

ඩී.එම්.ජයතිලක.